පුවත් වාතර්ාකරණයේ දී, මාධ්‍ය විසින් කරුණු සහ තොරතුරු මත පදනම් ව, අපක්ෂපාතීව පුවත් වාතර්ා කිරීමේ ඇති වැදගත්කම, Ethics Eye විසින් මින් පෙරද සංවාදයට බඳුන් කොට ඇත්තෙමු. එහිදී එම පුවත ඉදිරිපත් කරන මාධ්‍යවේදියාගේ හැඟීම් හෝ පක්ෂපාතීත්වයන් පුවතට කාන්දු නොවන ආකාරයට පුවත් ඉදිරිපත් කිරීමට මාධ්‍යවේදියා ප්රවේසම් වියයුතු වන්නේය.
තම පුත්රයා ඝාතනය කර නීතියෙන් සැඟවෙමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීමත්, බීමත්ව පැමිණ සිය තුන් හැවිරිදි දරුවාට පිලිස්සුම් තුවාල සිදුකළ සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීමත්, දිනමිණ හා දිවයින පුවත් වාතර්ාවන් තුළත්, හිරු ටීවී ප්රධාන පුවත් විකාශය තුළත් දැක්වී තිබූ අයුරු මෙම පසුබිම ඔස්සේ සලකා බැලිය හැක.
* මෙම පුවත් වාතර්ාවන් දෙක තුළත්, ප්රවෘත්ති විකාශය තුළත් එම සැකකරුවන්ව හඳුන්වා දී තිබුණේ "නරුම පියා" යනුවෙනි.
මෙහිදී,
මෙම පුවත කරුණු මත පමණක් පදනම්ව, අදාළ මාධ්‍යවේදියා සතු හැඟීම් හෝ පක්ෂපාතීත්වයන් පුවතට කාන්දු නොවන ආකාරයෙන් වාතර්ාකර ඇති බව ඔබ සිතන්නේද?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධමර් කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය ඍජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!